# ම'පුතණුවන්ට කියා දෙන්න....!

ඇමරිකා එක්සත් ජනපදයේ 16 වෙනි ජනාධිපති ඒබ්‍රහම් ලින්කන්තුමා ලොව පහළ වූ අද්විතීය ජනනායකයෙක් බව පොදුවේ පිළිගත් සත්‍යයකි. වරක් එතුමා තම පුතණුවන්ගේ පාසලේ ප්‍රධානාචාර්‍යතුමා වෙත ලිපියක් යවමින්, පාසල් අධ්‍යාපනයෙන් පියෙකු තම දරුවා තුළින් කෙබඳු වූ ගුණාංගයන් වර්ධනය වනු දකිනු රිසිදැයි දක්වා සිටියේය. මෙම ලිපිය අධ්‍යාපන පරමාර්ථයන් පිළිබඳ ලියවුනු විශිෂ්ඨ ගණයේ ලියවිල්ලක් ලෙසද පිළිගැනේ. සර්වකාලීන වටිනාකමකින් යුතු මෙම ලිපිය ගුරු දෙගුරු සියලු දෙනාටම උගත හැකි සාරගර්භ අදහස් වලින් සමන්විතය. මේ එහි සාරාංශයකි.



දයාබර ගුරුතුමනි,

හැකිනම් ම'පුතණුවන්ට මහත් දයාවෙන්, කාරුණිකව මේ කරුණු පහදා දෙන්න. සතුරුකම් කරන දුදනන් පරයා කළණ මිතුදම් රකින සුදනන් ඇති බවත්, මිනිසත් බව ලබා උපත ලැබූවද, සියලු දෙනාම උසස් ගුණ දහම් වලින් යුක්ත නොවන බවත්, සත්‍ය ගරුක නොවන බවත් ම'පුතණුවන්ට පහදා දෙන්න.

මහන්සියෙන් උපයා ගන්නා ශත දහය, ඇහිඳ ගන්නා ඩොලරයකට වඩා වටිනා බවත්, විභාග වලින් අසමත් වීම වංචාවෙන් සමත් වීමට වඩා යුක්ති යුක්ත බවත් නම්බුකාර බවත්, ජයග්‍රහණයේදී, ජයග්‍රහණය විඳීමටත් උගන්වන්න.

මෛත්‍රියෙන් සහ කරුණාවෙන්ද, සැර වැර වීමෙන්ද හික්මවිය යුත්තන් සිටින බව ඔහුට පැහැදිළි කර දෙන්න. එමෙන්ම අන් අය පවසන දේ හොඳින් කිරා බලා යහපත් දේ සමඟ සසඳා බලා යහපත් දේ පමණක් අගය කිරීමටත්, දුකේදී පවා සිනහසීමටත් උගැන්විය හැකි නම් අගනේය. කඳුළක් හෙළීම ලජ්ජාවට කාරණයක් නොවන බවද උගන්වන්න. පරාජයේ ඇති අසිරිමත් බවද, ජයග්‍රහණයේදී ලබන බලාපොරොත්තු කඩවීම් ගැනද පහදා දෙන්න. සමච්චලය මායිම් නොකිරීමටත්, චාටු පැසසුමෙන් නොරැවටෙන්නටත් උගන්වන්න.

හැකිනම්, පොත පතෙහි සැඟවුණු සුන්දරත්වය විඳගන්නා අයුරු පහදා දෙන්න. එසේම අහසෙහි නිදහසේ සැරිසරන කුරුල්ලන්, හිරු කිරණින් ඔද වැඩුණු මී මැස්සන්, නිල්වන් මිටියාවතේ පිපි, වන මල් ආදිය නරඹමින් ඒ තුළ සැඟවගත් අභිරහස් ගැන ඉතා ඕනෑකමින් සිතා බැලීමටත් කියා දෙන්න. කවුරු කෙසේ කීවද තමාගේම ආත්ම ශක්තියේ සුපිරි මහිමය ගැන ඔහුට පහදා දෙන්න.

කෙතරම් පලදායී වුවත්, අන් අය අනුකරණ නොකිරීමට ඔහුට උගන්වන්න. හැමදෙනාටම ඇහුම් කන් දීමටත්, එනමුත් ඉන් සත්‍ය පමණක් තෝරා බේරා ගන්නා ආකාරයත් ඔහුට පහදා දෙන්න.

තමාගේ දක්ෂතාවයන්ට සහ බුද්ධියට වැඩිම ලන්සුවක් තැබීමටත්, හදවත සහ ආත්මයට මිළ දර්ශකයක් එල්ලා නොගැනීමටත් ඔහුට උගන්වන්න. බොහෝ සේ ඉවසීමට තරම් ඔහු නිර්භීත විය යුතුයි. පොදු මානව හිතවාදය ළියලා යාමට නම් සද්ගුණය කෙරෙහි ඇති ඇදහීමත් - පැහැදීමත් ඉතා වැදගත් බව ඔහුට ඒත්තු ගන්වන්න.

මෙම කරුණු ඉතා බැරෑරුම් අපේක්ෂාවන් බව සත්තය. හැකි පමණ ඉටු කිරීමට කටයුතු කරන්න. ඔහු ඉතා විනීත සුන්දර දරුවෙකි. සැබවින්ම ඒ ම'පුතණුවන්ය.

මීට,
ඒබ්‍රහම් ලින්කන්

- සාමන්ත තැන්නගේ -




Fernandos
1/2 Price Removals



Are you looking for a low cost removals alternative?

If you're looking for a convenient, low cost alternative for interstate or international removals, you've come to the right place. Our single focus is to help you keep your removal costs to a minimum.

At Fernando's you can save up to half your removal costs by packing your own container.
Our patented truck design allows horizontal dropoff and pickup closer to your front door (non-tip = safer for your valuables).

We also do local removals In Perth WA
Custom Quarantine & clearance for International shipping in Western Australia.
Agents for Ceylon shipping for Srilankan community in Perth.





Call 1300 850 800 or Mobile 0412 684 300 & 0423 046 410
Fernando's 1/2 Price Removals
More Details at www.fernandoshalfprice.com.au